# ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට ජංගම දූරකථන ගිණුමේ ශේෂයෙන් Google Play සමග ගනු දෙනු කිරීම සඳහා Airtel පාරිභෝගිකයන්ට දැන් අවස්ථාවක්

ප්‍රථම වතාවට ශ්‍රී ලාංකික පාරිභෝගිකයන්ට තම Airtel රීචාජ් සහ රීලෝඩ් භාවිතා කරමින් Google Play වෙතින් Apps සහ අනෙකුත් ඩිජිටල් අන්තර්ගතයන් මිලදී ගැනීමේ හැකියාව උදා වී ඇත. මේ අනුව ඍජු වාහක බිල්පත් නම් AirPay සේවාව ඔස්සේ පෙර ගෙවුම් (Pre-Paid) පාරිභෝගිකයන්ගේ මිලදී ගැනුම් සඳහා වන ගෙවීම් ඔවුන්ගේ ජංගම දූරකතන ගිණුමේ පවතින මුදලින් පියවා ගැනීමෙන් සහ පසු ගෙවුම් (Post-Paid) පාරිභෝගිකයන් සිදු කරන මිලදී ගැනුම් සඳහා වන වටිනාකම ඔවුන්ගේ මාසික බිල් පතට එක් කිරීම ඔස්සේ මෙම ගනුදෙනුව සිදුවේ.

මේ වන විට ශ්‍රී ලංකාවේ ක්‍රෙඩිට් කාඩ් භාවිතය, විශේෂයෙන්ම තරුණ පරපුර අතර පවතින්නේ ඉතාම අවම මට්ටමකය. මේ අන්දමින් වර්තමානයේ ක්‍රෙඩිට් හා ඩෙබිඩ් කාඩ්පත් නොමැති අය සඳහා අන්තර්ජාලය ඔස්සේ සිදු කරන ගනුදෙනු සඳහා සාර්ථක විකල්පයක් හඳුන්වා දීමට Airtel පසුගියදා Google සමග සහයෝගීතාවයකට එළැඹිණ. ඒ අනුව ඉතා පහසුවෙන් තම ජංගම දූරකථන ඔස්සේ 40%ක් වේගවත් අන්තර්ජාල ප්‍රවේශයන් ද සමගින් Google Play හි සුරක්ෂිත භාවයද මිලදී ගැනීමේ හැකියාව ලබන මෙරට ප්‍රථම ජංගම දූරකථන සේවා පාරිභෝගිකයන් බවට Airtel පාරිභෝගිකයන් පත්වනු ඇත. එබැවින් දැන් එයාර්ටෙල් පාරිභෝගිකයන්ට Google Play Store වෙතින් මුදල් ගෙවා ලබාගත හැකි නවතම චිත්‍රපට, අධ්‍යාපනික අන්තර්ගතයන් ඇතුළු මිලියන් ගණනක Apps වෙත ඉතා පහසුවෙන් ප්‍රවේශ වීමේ අවස්ථාව උදා වී තිබේ.

"අද බොහෝ දෙනා අන්තර්ජාලය සමග සම්බන්ධ වී සිටියත් තමන්ගේ ක්‍රෙඩිට් කාඩ් එකක් නොමැති නිසා අන්තර්ජාලය සමග ගනුදෙනු කිරීමේ හැකියාව සීමා වී තිබෙනවා. නමුත් Google සමග ඇති කරගත් මේ නව සහයෝගිතාවය තුළින් අපේ පාරිභෝගිකයන්ට එවැනි ගනුදෙනු ඉතා පහසුවෙන් සහ සුරක්ෂිතව කිරීමේ හැකියාව ලැබෙනවා." මේ පිළිබඳව අදහස් දක්වමින් Bharti Airtel ලංකා සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී/කළමණාකාර අධ්‍යක්ෂ ජිනේෂ් හෙග්ඩේ මහතා පැවසීය. "මෙය ඩිජිටල් වෙළෙඳ ප්‍රජාවට සහ App Stores වලට ජංගම දූරකථන සේවා මෙහෙයවන්නන් වෙත ප්‍රවේශ වීමේ අවස්ථා උදා කර දෙන පාරිභෝගික අවශ්‍යතා වෙනුවෙන්ම හැඩගන්වන ලද විශිෂ්ට ගනුදෙනු කිරීමේ ක්‍රමයක්." ඒ මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

තම Google Play ගිණුම් මෙනුවේ ඇති ගෙවීමේ ක්‍රම (Payment Methods) වල සඳහන් වන 'Use Airtel Billing' එක් කරගැනීම මගින් පාරිභෝගිකයන්ට ඉතා පහසුවෙන් AirPay සේවාව තම ඇන්ඩ්‍රොයිඩ් දූරකථන වල සක්‍රීය කරගත හැක. සක්‍රීය කරගැනීම සම්පූර්ණ වූ සැනින් ගනුදෙනුව සිදු කිරීම සඳහා පාරිභෝගිකයා සිදුකළ යුතු වන්නේ 'Buy' ක්ලික් කර 'bill my airtel account' තෝරා අනතුරුව

මිලදී ගැනීම තහවුරු කිරීම සඳහා තම Google ගිණුමේ මුරපදය (password) ලබාදීම පමණි.

පාරිභෝගික විශ්වාසය නංවාලීම සඳහා සහ ගනුදෙනු වලදී සිදුවන අත් වැරදීම් මග හරවා ගැනීම සඳහාද AirPay සේවාව මුදල් ආපසු ගෙවීමේ විකල්පයන්ද හඳුන්වාදී තිබේ. මේ අනුව පාරිභෝගිකයයෙකුට තම Google Play ගිණුම් මෙනුවේ 'Order History' ඔස්සේ පැය 2ක කාලයක් තුළ තම ගනුදෙනුව නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව අවශ්‍ය නම් මුදල් නැවත ලබා ගැනීමේ පහසුකමද පවතී.

## Bharti Airtel Lanka (Pvt) Ltd පිළිබඳව වැඩිදුරටත්

ලොව පුරා රටවල් 17ක සේවා සපයන ලෝකයේ තෙවනි විශාලතම විදුලිසංදේශ ජාල ප්‍රතිපාදකයාය. 2009 වසරේ සිට එය ශ්‍රී ලංකාව තුළ සිය වාණිජ මෙහෙයුම් කටයුතු අරඹමින් මෙරට විදුලිසංදේශ සේවා අතරින් මිලියනයක පාරිභෝගික සීමාව වෙත වේගයෙන්ම ළඟාවූ අදාළ සේවා සැපයුම්කරු බවට පත්වන්නේද Airtel ය. සියළුම හවුල්කරුවන්, පාරිභෝගිකයන්, යෞවනයන් වෙත කෙරෙන සමස්ත සැපයුම්දාමය සැබෑලෙසම අත්විඳීමට සලස්වමින්, සියළුම පාර්ශ්වකරුවන්ට දනෙන පරිදි ගෞරවපූර්වකව, කැපවීමෙන් කටයුතු කිරීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය පොහොසත් කිරීමේ අවශ්‍යතාව පෙරදැරිව Airtel සමාගමේ ආයතනික සමාජ වගකීම් ප්‍රතිපත්තිය, සමාජයේ අවශ්‍යතා සන්තර්පනය කරමින් වඩාත් සජීවීව පවත්වාගෙන යනු ලැබේ. ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු www.airtel.lk වෙබ් අඩවියේ දැක්වේ.

මාධ්‍ය තොරතුරු සඳහා
ෆියෝනා නානායක්කාර
Bharti Airtel Lanka
0755841523
fiona.nanayakkara@airtel.com

Suzanne Byrde
GPR Communications (Dentsu Aegis Network)
011235888
suzanne@gpr.lk